# 23

# මුස්ලිම් වීරවරුන් දෙදෙනා

## ජයග්‍රාහී වීර සලාහුද්දීන් අයියූබි



ඉස්ලාමීය ඉතිහාසයේ කීර්තිමත් වීරවරුන් රැසක් අතර සුල්තාන් සලාහුද්දීන් අයියූබි මහත් ප්‍රසිද්ධියක් දරන වීරවරයෙකි. ඉස්ලාමීය අධිරාජ්‍යයට විරුද්ධව යුධ වදින විට එය රැක ගැනීමට ඔහු කළ සේවය ඉතිහාසයේ විශේෂ ස්ථානයක් දරයි.

ක්‍රිස්තු වර්ෂ 1138ට සමගාමී වන, එනම් හිජ්රි 532හි දී ඉරාකයේ "දික්රිද්" යන නගරයේ කුර්තිෂ් කුලයේ ගෞරවනීය පවුලක මෙතුමා උපත ලැබුවේ ය. මෙතුමාගේ පියා හා සුළු පියා දේශපාලනය, පරිපාලනය හා යුද හමුදව ආදී අංශවලින් දක්ෂතා හා අත්දැකීම් ඇති අය ලෙස දක්නට ලැබුණු හෙයින් සලාහුද්දින් අයියූබි කුඩා කල සිට ම එම ගුණාංග මුසු කොට ගනිමින් ඇති දැඩි විය.

ඉමාමුද්දීන් (Z)සන්කී තුමාගේ රාජ්‍ය පාලනයේ පරිපාලන ක්ෂේත්‍රයේ සේවය කිරීම සඳහා එතුමාගේ පියා ඇරයුම් ලද හෙයින් ළදරු කාලයේ සිට ම පියා සමග කුඩා සලාහුද්දීන් ද දික්රිද් නගරයේ සිට මව්සිල් නගරයේ පදිංචියට ගියේ ය. එහි දී එතුමා වෙනත් වීරවරුන් සමග එක් ව අශ්වාරෝහණ පුහුණුව, යුද පුහුණුව, පරිපාලනමය පුහුණුව ද ලැබුවේ ය. තව ද අල් කුර්ආන්, අල් හදීස් සහ අරාබි භාෂාව ආදිය සාර්ථකව හැදෑරීමේ භාග්‍යය ද එතුමාට ලැබිණි.

තරුණ අවධියට පත්වන විට සලාහුද්දීන් අයියූබි විවිධ නායකත්ව වගකීම් දැරිය හැකි, විවිධ දක්ෂතාවලින් පෝෂණය විය. කලහකාරීව කටයුතු කළ ෆාතිමියියා නම් කණ්ඩායම මෙල්ල කිරීමට උසස් ගුණාංගවලින් යුක්තව විවිධ දක්ෂතා දක්වමින්, විශේෂයෙන් හමුද ක්ෂේත්‍රයේ දක්ෂතාවලින් එතුමා දීප්තිමත් විය. ඊජිප්තුවට යවන ලද සේනාවට මෙතුමා සහාය සෙන්පති ලෙස පත්කරන ලදී. එහි සෙන්පති වූයේ මෙතුමාගේ සුළු පියා වන අසදුද්දීන් ය. මෙම අවස්ථාවේ ෆාතිමියියාවරුන් විසින් ඇති කරන ලද කලහකාරී තත්ත්වය සහ කුරුස සේනාවේ තර්ජනයෙන් ද ඊජිප්තුව මුදවා ගැනීමේ අවශ්‍යතාව අවබෝධ කරගත් සෙන්පති නූරුද්දීන් (Z)සන්කී තුමා, සලාහුද්දීන්ගේ සුළු පියා වන සෙන්පති අසදුද්දීන්ගේ නායකත්වයෙන් ඊජිප්තුවට සේනාවක් යැව්වේ ය. එවිට තරුණ සලාහුද්දීන් සහාය සෙන්පති වශයෙන් කටයුතු කළේ ය.

සුළු පියාගෙන් පසු ඊජිප්තුවේ පරිපාලනය සලාහුද්දීන් තුමා භාර ගත්තේ ය. සලාහුද්දීන් තුමා ඒ වන විට ඉස්ලාමීය අධිරාජ්‍යය පත්ව තිබූ දුක්ඛිත තත්ත්වයෙන් එය මුදවාගෙන නැවත එහි ආශ්චර්යය විධිමත් ලෙස ඉස්මතු කරලීමට අවස්ථාවක් උද කළේ ය. ඒ සඳහා සියලු කටයුතු ඉතා වේගයෙන් විශිෂ්ට ලෙස ඉටු කළේ ය. මොහුගේ පෞරුෂ ගුණාංග අවධානයට ලක් කළ එකල ඉස්ලාමීය අධිරාජ්‍යයේ පාලකයින්ගෙන් අධික පිරිසක් මොහුගේ නායකත්වය යටතේ එක්වීමට ඉදිරිපත් වූහ. එම පසුබිම මත ඊජිප්තුව, සිරියාව හා ඒ අවට ප්‍රදේශ ඇතුළත් වන ලෙස අයියූබිගේ පාලනය සිදු විය. ඉතා කෙටි කාලයකින් බලවත් රාජ්‍යයක් ලෙසට මෙය වෙනස් වුව ද එහි පාලන කටයුතු සිදු වූයේ මධ්‍යම පාලනය සිදු වූ අබ්බාසීය පාලනයට ගෞරව කරන අයුරින් ය.

ප්‍රබල පාලකයකු ලෙස වෙනස් වූ සුල්තාන් සලාහුද්දීන් තම දිගු කාලීන සිහිනයක් වූ බයිතුල් මුකද්දිසය මුදවා ගැනීමේ සේවයෙහි නියැලුණේ ය. මෙම සේවය සඳහා ඉස්ලාමීය උගතුන් රාශියක් යෙදවූයේ ය. මෙමගින් එතුමා යුධ හමුදව ශක්තිමත් කළේ ය.

මෙවන් නොසැලෙන උත්සාහයක් මගින් එතුමා බලවත් හමුදවක් ගොඩනැගී ය. වසර ගණනාවක් පුරා ඉවසීමෙන් ද අධිෂ්ඨානපූර්වකව ද සූදනම් කරන ලද හමුදව තම ප්‍රධාන ඉලක්කය වූ බයිතුල් මුකද්දිසය මුද ගැනීමේ සේවයෙහි අවසාන සටනට සූදනම් විය.

ක්‍රි. ව. 1187 එනම් හිජ්රි 583හි ක්‍රිස්තියානි කුරුස සේනා හමුදවට විරුද්ධව සුල්තාන් සලාහුද්දීන්ගේ නායකත්වයෙන් ඉස්ලාමීය හමුදව **"හිත්තීන්"** යුද්ධයේ මහත් සටනක නිරත විය. අවසානයේ සුල්තාන්ගේ සේනාව අල්ලාහ්ගේ සහාය ඇතිව ජයග්‍රහණය ලැබීය.

මෙම ජයග්‍රහණය මගින් බයිතුල් මුකද්දිසය නැවත මුස්ලිම්වරුන් අතට පත් වීමේ දොරටු විවර වී හිත්තීන්ගේ මුස්ලිම් සේනාව ජය ලබා මාස දෙකක් තුළ බයිතුල් මුකද්දිසය මුස්ලිම්වරුන් සන්තක විය. මෙම පුවත මගින් මුස්ලිම් අධිරාජ්‍යයේ පරිපූර්ණ සේනාවක් ඇති කිරීමෙන් සුල්තාන්ගේ ගෞරවය හා සැලකිල්ල ඉහළ නැංවීමට හේතු විය. සමස්ත මුස්ලිම් ප්‍රජාව සුල්තාන්ගේ නායකත්වයට ගරු කළහ.

පලස්තීනය අත්පත් කර ගත් මුස්ලිම්වරු කුරුස සේනාව මුස්ලිම්වරුන්ට විරුද්ධව දියත් කළ මැරවරකම්වලට ඔවුන්ගෙන් පළි ගැනීම සඳහා කිසි දු ක්‍රියාවක් සිදු නොකළහ. එහෙත් සුල්තාන්ගේ ඉල්ලීමට අනුව පරාජයට පත් වූ ඔවුන්ට ගෞරව කළහ. එහි විසූ ක්‍රිස්තියානි අයට ද, යුදෙව් අයට ද පොදු සමාව දෙන ලදී. එපමණක් නොව අවශ්‍යතාවට අනුව ඔවුනට ප්‍රවාහන පහසුකම් ද සපයන ලදී. එහෙත් කළ ගුණ නොමැති, පරාජය දරාගත නොහැකි යුරෝපීය ජාතිකයෝ නැවත සේනාවක් සූදානම් කර තවත් සටනකට ප්‍රවේශ වූහ. සටනට පැමිණෙන අතර මග ඔවුහු දහස් සංඛ්‍යාත මුස්ලිම් පිරිසක් ඝාතනයට ලක් කළහ. නැවතත් දෙපිරිස ම සටන් කර අවසානයේ රිචඩ් නමැත්තාගේ කුරුස සේනාව පරාජය වී පසුබැමට ලක් විය. ජෙරුසලම හා ඒ අවට ඇති බොහෝ ප්‍රදේශ මුස්ලිම්වරුන් සතු විය.

සුල්තාන්ගේ මානුෂීය ගුණාංග පිළිබඳව වර්තමාන යුරෝපීයන් ද ප්‍රශංසා කරති. ඊජිප්තු සේනාධිපති තුමා අසනීප වූ විට, තම වෛද්‍යවරයා යවා බෙහෙත් කරවූවා පමණක් නොව ඔහුගේ අශ්වයා මිය ගිය විට උසස් කුලයේ අශ්වයකු ද ඔහුට තිළිණ කළේ ය. ඉතිහාසයේ සුල්තාන් සලාහුද්දීන් වැනි පාලකයකු දකීමට පවා නොලැබේ යැයි පැවසිය හැකි පමණට ආදර්ශවත් පාලකයකු ලෙස ඔහු බලසම්පන්න විය. අල්ලාහ්ගේ දීන් (ධර්මය) අධිෂ්ඨානපූර්වකව පිළිපැදීමෙහි ලා ආදර්ශවත් පුද්ගලයකුව සිටියේ ය.

ඉතිහාසය තුළ මහා වීර සලාහුද්දීන් අයියූබි යනුවෙන් සනිටුහන් වීමට මොහුගේ මෙම ශ්‍රේෂ්ඨ යහ ක්‍රියා හේතු විය. මෙවන්නන්ගේ ජයග්‍රහණයන් වර්තමාන මුස්ලිම් සමාජයේ කිසිවකුටත් අත්පත් කර ගැනීමට නොහැකි විය.

සුල්තාන් සලාහුද්දීන් අයියූබි රහ්මතුල්ලාහි තුමා ක්‍රි. ව. 1193දී, එනම් හිජ්රි 589 සෆර් මස තම 59 වන වියෙහි දී වෆාත් වූයේ ය.

# සුල්තාන් මුහම්මද් අල් ෆාතිහ් තුමා



සුල්තාන් මුහම්මද් ක්‍රි. ව. 1432 වසරේ මාර්තු මස 30 වන දින සුල්තාන් දෙවන මුරාද්ගේ පුතකු ලෙස මෙලොව එළිය දුටුවේ ය. ඉතිහාසය තුළ මොහු "ජයග්‍රාහක" යන අර්ථය ඇති **අල් ෆාතිහ්** යන ගෞරවනීය නාමයෙන් අමතනු ලැබී ය. එබැවින් මුහම්මද් අල් ෆාතිහ් යනුවෙන් එතුමා හඳුන්වන ලදී.

උස්මානීය අධිරාජ්‍යයේ කුමාරවරුන්ට ශාරීරික, අධ්‍යාපනික හා ආධ්‍යාත්මික වශයෙන් උසස් පුහුණුවක් ලබා දීම එකල රජ පරපුරේ සම්ප්‍රදායයක් ලෙස දක්නට ලැබුණි. එබැවින් සුල්තාන් මුහම්මද් අල් ෆාතිහ් තුමාව ද, ළමා කාලයේ පටන් යහපත් ලෙස ඇති දැඩි කරන ලදී. කුඩා කල සිට ම අල් කුර්ආන්, හදීස්, ෆික්හු වැනි ඉස්ලාමීය කලාවලින් එතුමා පෝෂණය විය. ඒ සමග ගණිතය, විද්‍යාව, තාරකා විද්‍යාව, හමුද ක්ෂේත්‍රයේ කලාවන් ආදිය එතුමාට උගන්වනු ලැබී ය. මුහම්මද් අල් ෆාතිහ් තුමා මෙම සියලු ක්ෂේත්‍රවල දක්ෂයෙක් විය. එතුමා අරාබි, පර්සියානු, තුර්කි, ලතින්, ග්‍රීක භාෂාවල ද නිපුණතාව ලැබීය.

එපමණක් නොව, ළමා කල පටන් දේශපාලනික අත්දැකීම් ලබා දීම සඳහා රාජ පවුල්වල අයට කුඩා ප්‍රදේශවල පාලන වගකීම (බලය) භාර දීම උස්මානීයවරුන්ගේ සම්ප්‍රදායයක් විය. ඒ අනුව මුහම්මද් අල් ෆාතිහ් තුමා "**මක්නීදියා**" යන ස්ථානයේ පාලකයා ලෙස තම වයස අවුරුදු 12 දී පත්කරනු ලැබී ය. මොහුට අවශ්‍ය සෑම අංශයක් ම පුහුණු කිරීමට කටයුතු කරමින්, කීර්තිමත් විද්වතුන් වන ෂෙයික් ආක් ෂම්සුදීන් හා මුල්ලා කව්රානි යන දෙදෙනා මග පෙන්වූහ. මෙලෙස මුහම්මද් අල් ෆාතිහ්ගේ පෞරුෂත්වය ගොඩනැගීමට ඉහත ගුරුවරුන් දෙදෙනාගෙන් ලද සේවය අතිශය වැදගත් විය.

එකල කැමරන් ප්‍රදේශයේ රජතුමා උස්මානීය අධිරාජ්‍යයට එරෙහි ව සටන් කළේ ය. එහෙත් එය ඉතා පහසුවෙන් ජය ගැනීමට දෙවන සුල්තාන් මුහම්මද් සමත් විය. එය ඉතා පහසුවෙන් ජය ගත්තේ ය. මෙය දෙවන සුල්තාන් මුහම්මද්ගේ ප්‍රථම යුද්ධය ද, ප්‍රථම ජයග්‍රහණය ලෙස ද ඉතිහාස ගත විය.

මුහම්මද්ගේ ගුරුවරයා වන ආක් ෂම්සුදීන්, "කොන්ස්තන්තිනෝපලය වීරයකු විසින් ජයග්‍රහණය කරනු ලබයි. එම සේනාධිපති ශ්‍රේෂ්ඨ සේනාධිපති ය. සේනාව ශ්‍රේෂ්ඨ සේනාව ය" යන හදීසය තම සිසුන්ට නිතර නිතර සිහිගන්වා ඒ කෙරෙහි නිසිමග පෙන්වමින් සිටියේ ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මුහම්මද් කොන්ස්තන්තිනෝපලය ජය ගැනීම සඳහා ඉස්ලාමීය ඉතිහාසයේ නිතර සිදු වූ සටන් අතර උස්මානීය රජවරුන්

දියත් කළ යුද්ධ ක්‍රමෝපායයන් පිළිබඳ දැනුමක් ඇති ව සිටියේ ය. තව ද මෙම ජයග්‍රහණය පිළිබඳව නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාගේ අනාවැකිය ද දැඩි ලෙස ඔහු සිතෙහි මුල්බැස ගත්තේ ය.

ක්‍රි. ව. 1453හි මුහම්මද් අල් ෆාතිහ්ගේ නායකත්වයෙන් 50,200 ක් පමණ වූ මුස්ලිම් සේනාව බයි(Z)සාන්තිය මහරජතුමාගේ බලකොටුව (කොන්ස්තන්තිනෝපලය) දෙසට පිටත් වූහ. කොටුවට ආසන්න වන විට ෆාතිහ් තුමා තම සේනාව කොටස් වශයෙන් වෙන් කර බෙදා එය විවිධ ප්‍රදේශවලින් වටලෑම පිණිස නතර කළේ ය. ඔහුගේ නාවික හමුදාව ද මුහුද දෙසින් පැමිණියේ ය. ෆාතිහ් තම සේනාව සමග ඉදිරියට ගමන් කරමින් උපදෙස් ලබා දුන්නේ ය.

මුස්ලිම්වරුන්ගේ සේනාව දුටු කොන්ස්තන්තිනෝපලයේ රජතුමා යුරෝපීයන්ගෙන් සහාය සේනාවක් යවන ලෙස ඉල්ලා සිටියේ ය. ඒ අනුව පසුදින යුරෝපීය සේනාව විශාල නෞකාවකින් ද, තවත් පිරිසක් බෝට්ටු මගින් ද පැමිණියහ. මෙය බයි(Z)සාන්තීය වරුන්ට මානසික ප්‍රබෝධයක් විය. මෙම අවස්ථාවේ මුහම්මද් අල් ෆාතිහ් තුමා කොටුවේ රජතුමාට ලිපියක් යැව්වේ ය. "ඔබතුමාගේ කොන්ස්තන්තිනෝපල් නගරය අපහට භාර කර යහපත් පාලනයකට සහයෝගය ලබා දෙන්න. නැතිනම් සෑම පුද්ගලයකු ම පුද්ගල බදු ගෙවා ඉස්ලාමීය අධිරාජ්‍යය යටතේ යහපත් පාලනයක් ගෙන යන්න. සැබවින් ම මාගේ සේනාව ජීවිතය පිළිබඳව හෝ දේපළ පිළිබඳව හෝ සම්පත් පිළිබඳව හෝ තැකීමක් නොකරති," යැයි අවධාරණය කළේ ය. මෙය දුටු රජු කෝපයෙන් පිබිදුණේ ය. සටන් කරන බවට අධිෂ්ඨාන පූර්වකව දැනුම් දුන්නේ ය. කොටුවේ වීරවරු සටන සඳහා සූදානම් වූහ.

මුස්ලිම් සේනාව තමා සන්තකයේ පැවති විශාල කාලතුවක්කු යොදා ගෙන කොටුවේ ආරක්ෂිත ස්ථාන වෙත ප්‍රහාර එල්ල කිරීම ආරම්භ කළෝ ය. මුහම්මද් අල් ෆාතිහ් තුමා දිනක් බොහෝ අපහසුතා මධ්‍යයේ කිසිවකුටත් සිතීමට පවා නොහැකි ආශ්චර්යවත් සැලැස්මක් යෙදුවේ ය. එය තම සේනාධිපතිවරුන් සමග හුවමාරු කර ගත්තේ ය. මෙම සැලැස්ම සේනාව දැනගත් වහා ම කට විවර කර පුදුමයට පත් වූහ. සමහරු මෙය කළ හැකි වේ දැයි සැක පළ කළහ. කෙසේ හෝ එම සැලැස්ම මුහම්මද් ෆාතිහ් තුමා නායකත්වය ගෙන, ඉදිරිපත් වී තම සේනාවේ සහයෝගයෙන් සාර්ථකව කර අවසන් කළ පසුව සේනාව එය කොපමණ අපහසු ක්‍රියාවක් ද, කොතරම් ආශ්චර්යවත් සැලැස්මක් ද යන්න වටහා ගත්තේ, එය අවසන් වූ පසු ය.

කොටුව පිටුපස විශාල ජල ස්කන්ධයක් දක්නට ලැබේ. එය "අල් කර්නුස්(z)සහබ්" නම් වේ. ඒ සමග ම කඳු වැටියක් ද, තිබේ. එම ජල ව්‍යාප්තියේ නැව් මගින් ගියේ නම් පහසුවෙන් කොටුව අත්පත් කරගත හැකි ය. රාත්‍රිය මුළුල්ලේ ෆාතිහ් තම සේනාව මගින් කඳු කැලෑවේ මධ්‍යම ප්‍රදේශයෙන් "කර්නුස්(z)සහබ්" දක්වා ගස් කපා සැතපුම් තුනකට පමණ දුරකට විශාල රේල් පාරක් ඉදි කළේ ය. පසුව එය දිගේ එක ම රාත්‍රියේ තම නැව් 70 ඇදගෙන ගොස් කර්නුස්(z)සහබ් නම් ප්‍රදේශයේ නතර කළේ ය.

පසු දින අලුයම මුහම්මද් තවත් නව සැලසුම් රැසක් රැගෙන, පෙළ ගැසී සිටින සේනාව ඉදිරියට පැමිණ ඔවුන් ඇමතුවේ ය. වීරවරුන් ධෛර්යවත් කළේ ය. "ජයග්‍රහණය නොහොත් වීර මරණය" යන මන්ත්‍රණය නැවත නැවත පවසා දිරිමත් කළේ ය. තව ද යුද අවස්ථාවේ දී පොදු ජනයා අසාධාරණ ලෙස ඝාතනයට ලක් නොකරන ලෙස ද, ළදරුවන්, කාන්තාවන්, වයෝවෘද්ධයින් වෙත දයාව දක්වන මෙන් ද අන්‍ය දේවස්ථාන හා අන්‍ය ආගමික නායකයන් කෙරෙහි ගරු කර කටයුතු කරන මෙන් ද පවසා බොහෝ යුධ උපක්‍රම තදින් පිළිපදින ලෙස ද පැවසුවේ ය. සුපුරුදු පරිදි සටන ආරම්භ විය. පෙර දින කාලතුවක්කු පරීක්ෂා කළ ස්ථාන ම ඉලක්ක කර කාලතුවක්කු ප්‍රහාර එල්ල කළහ. මෙවර කාලතුවක්කු සේනාවට කුළුණු මත රැඳී සිට අල්ලා ගැනීමට නොහැකි විය. එක් ප්‍රදේශයක කෝලාහලයක් ආරම්භ වී මහත් සටනක් ඇති විය. කර්නුස්(z)සහෆි හි ගොඩ බැස්වූ නැව් පියවරින් පියවර ඉදිරියට පැමිණියේ ය.

කොන්ස්තන්තිනෝපලය අත්පත් කර ගැනීමට වසර ගණනාවක් මුළුල්ලේ විවිධ සටන් ඇති වූව ද කිසිවකුටත් එය ඉටු කර ගැනීමට නොහැකි විය. තවදුරටත් කිසිවකු විසින් එය සිදු කළ නොහැකි එකක් බවට එම ජනතාව විශ්වාස කරමින් සිටිය හ. එහෙත් එය තරුණ වීර පෝතක මුහම්මද් අල් ෆාතිහ් විසින් පරිපූර්ණ වශයෙන් ඉටුකරන ලදී. සතියකින් සටන අවසන් විය. කොන්ස්තන්තිනෝපල් කොටුව මුළුමනින් ම මුස්ලිම්වරුන් සතු විය. පසුව කොන්ස්තන්තිනෝපලය ඉස්ටැන්බුල් ලෙස නම් කරන ලදී.

## ජයග්‍රහණයෙන් පසු සිදු කළ වීර ප්‍රකාශය

''මාගේ දයාබර සහෝදරයිනි, ඔබ කොන්ස්තන්තිනෝපලය ජයගත් වීර සෙබළුන් වී හමාර ය. ඔබ නබි තුමාගේ රන් වදන් වලට නිදසුනක් වූවෙහු ය. එතුමාගේ සුභාශිංසනය ලැබුවෝ ය. වැඩිහිටි සහාබාවරුන්ගේ ද, අපට පෙර සිටි අයගේ ද සිහින සැබෑ කරවූවෝ ය. අල්ලාහ් අප සියලු දෙනාට ම යහපත ලබා දෙත්වා. මාගේ දයාබර වීරවරුනි, මෙම ජනතාවට යහපත සලසන්න. ඔවුන්ට දයාව ලබා දෙන්න. කවරකුට හෝ කිසි දු හේතුවක් මත හෝ අයුක්තියක් සිදු නොකරන්න. දේවස්ථානවලට ද ආගමික නායකයින්ට ද ගෞරවයෙන් සලකන්න. ඉස්ලාම් පවසන ශ්‍රේෂ්ඨ සාරධර්ම මෙය වේ,'' යැයි ජයග්‍රාහී වීර මුහම්මද් සිය ජයග්‍රහණයෙන් අනතුරුව සිය හමුදාව අමතා ප්‍රකාශ කළේ ය.

මෙසේ සුළු ප්‍රකාශයක් නිකුත් කිරීමත් සමග ම තක්බීර් නාදය රැව් පිළිරැව් දුන්නේ ය. මුහම්මද් තම අසුපිටින් බැස අල්ලාහ්ට ස්තුති කිරීම පිණිස සලාත් රකඅත් දෙකක් ඉටු කළේ ය. මුස්ලිම්වරුන්ගේ ජයග්‍රහණය ආරංචි වූ ජනතාව බියෙන් තැතිගෙන පිළිසරණ පතා ක්‍රිස්තියානි දේවස්ථානවලට ඇතුළු වූහ. මුහම්මද් තුමා ඔවුන් ඉදිරියට ගොස් අප ඔබ හට කිසි දු අකටයුත්තක් සිදු නොකරන බව පවසා පෙර ජීවත් වූයේ කෙසේ ද, එලෙස ම තම වාසස්ථානවලට ගොස් සතුටින් සිටින ලෙස දැනුම් දුන්නේ ය. තමන් වැනසීමට

පැමිණි අය ද මෙසෙ පවසන්නේ යැයි කියමින් ඔවුහු විස්මයට පත් වූහ. තම ජීවිතවලට ද දේපළවලට ද කිසි දු හානියක් නොවීම පිළිබඳ එම ජනතාව සතුටට පත් වූහ. මුහම්මද් අල් ෆාතිහ් වර්ෂ 1481හි (හිජ්රි 886හි) තම 52වන වියෙහි දී වෆාත් වූයේ ය.

**අභ්‍යාස**

1. සුල්තාන් සලාහුද්දීන් අයියූබි යන මාතෘකාවෙන් පහත කරුණු ඇතුළත් කර රචනාවක් ලියන්න.

★ උපන් වසර ★ උපන් ස්ථානය ★ පුහුණුව ලැබූ ස්ථානය

★ පියාගේ රැකියාව ★ විශේෂ දක්ෂතා ★ මානුෂීය ගුණාංග

★ ජයග්‍රහණය ★අභාවයට පත්වූ වසර හා මාසය

2. හිත්තීන් යුද්ධය පිළිබඳ කෙටියෙන් ලියන්න.

3. "කොන්ස්තන්තිනෝපලය ජය ගත යුතු ය" යන හැඟීම් අල්ෆාතිහ් තුමා තුළ ඇති වීමට හේතු වූ කාරණාව කුමක් ද?

4. කොන්ස්තන්තිනෝපලය ජය ගැනීමට අල්ෆාතිහ් තුමා යෝජනා කළ විශ්මයජනක වූ සැළැස්ම කුමක් ද?

5. ලෝක සිතියමක කොන්ස්තන්තිනෝපලය පිහිටා ඇති ස්ථානය ලකුණු කර පෙන්වන්න.